**2019 පෙබරවාරි මස 04 වන දින සිට 2019 පෙබරවාරි මස 10 වන දින දක්වා**

**ප්‍රශංසා එකතු සුපුවත**

**'දෙවියන් වහන්සේගේ කැමැත්ත මුළුමනින් ඉටුකිරීම අපට සුදුසුය '**

01. ප්‍රශංසව සඳහා යොමුව :

* ශු.මතෙව් 3:15 **ජේසුස් වහන්සේ ඔහුට උත්තර දෙමින්,"දැනට ඉඩ දෙන්න; මෙසේ දේව කැමැත්ත මුළුමනින් ඉටු කිරීම අපට සුදුසුය."**
* ක්‍රිස්තුන් වහන්සේ ජෝර්දාන් ගඟට බැස්සේ ඇයි? පාපිෂ්ඨ වූ මනුෂ්‍ය රාජ්‍යය මහෝත්තමයාණන්ගේ ප්‍රේමයේ පාලනයට නතු කිරීමටයි.සදාකාලික වූ ප්‍රේමයේ රාජ්‍යය පිහිටුවීමටයි. ඒ සඳහා සැම විට, සැම තැන මුළු දිවිය පුරාම දේව අභිමතය ඉටුකිරීමයි පුත්‍රයාණන්ගේ අරමුණ වූයේ.
* එහෙයින් ක්‍රිස්තුන් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්පය ඔබ තුළත් පවතීවා යනුවෙන් ශු.පාවුළුතුමා පවසන්නේ අපගේ දැක්මද එසේම විය යුතු බවයි.
* එසේ රාජ්‍යය සඳහා කැඳවීමට වරම් ලත් අපි මහෝත්තමයාණන්ට ප්‍රශංසා කරමු.
* පුබුදු ගී අංක 131 "පුරා හදවතින්...."

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම.

03. සතියේ සුපුවත :

(අ) දූත කාර්යය ආරම්භයේදීම ක්‍රිස්තුන් වහනසේ තුළ තිබූ අභ්‍යන්තර පෙළඹීම කුමක්දැයි ශු.මතෙව් 3:15 වගන්තිය මුල් කරගෙන කුඩා කණ්ඩායම් තුළ බෙදා ගන්න.

(ආ) පිබිදුනු කිතුනු ශ්‍රාවකයෙක්, පුබුදු පවුලක්, පුබුදු සංඝයක් ලෙස සැම විටම, සැම තැනම සියළු කාරණාවලදී ක්‍රිස්තුන් වහන්සේ තුළ තිබූ ජීවිත ආකල්පය තුළ ඔබ /මා /අප පැවතුනේද නැත්නම් විවිධ මතවාද වලට යට වී සිටියේද යන්න මඳක් කථා බහ කරමින් විමසා බලන්න.

(ඇ) අප විසින් එසේ කළයතු සේම කොපමණ දුරට දේව කැමැත්ත ඉටු කිරීමට මෙන්ම රාජ්‍යය පිළිබඳ දැක්ම අපගේ ජීවිත ආදර්ශය මගින් අනිත් අයවද ඊට යොමු කිරීමට අවංක පිපාසයක් තිබුණේදැයි බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා :

* මනුෂ්‍ය රාජ්‍යය පාපිෂ්ඨයි, කාලීනයි. සදාකාලික වූ දේව රාජ්‍යය නමැති ජීවිත දර්ශනය ඔස්සේ ජීවිත ගමනක යෙදෙන අපට, ගමන තුළ සවිය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේයි. ඔවුන් වහන්සේගෙන් අපගේ සිත් පුරවනු ලැබීමට නම් මනස්ථාපනයේ යතුර අප අත තබා ගෙන සිටිය යුතුය. මනස්ස්ථාපනය වීමේ සිතක් අප තුළ තිබිය යුතු ය.
* විශේෂයෙන්ම අප රටේ දේශපාලඥයන්ට ගැතිකම් කරමින් ඔවුන් පිහිටුවන පාපිෂ්ඨ රාජ්‍යය, මනුෂ්‍ය රාජ්‍යය කෙරෙහි සිහින මැවීම, ඊට උර කර දීම නිෂ්ඵල ක්‍රියාවකි. මිනිස් ආත්මාර්ථය, සාතන් පරාජය කරන යුගය එළඹී ඇත. බලය - ධනය - මානය නමැති පරීක්ෂාවන් ජය ගනිමින්, දේව පුත්‍රභාවයේ අභිමානය ප්‍රකාශ කරමින් දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමට දෙවියන් වහන්සේ නිරතුරුවම අප අවදි කරන සේක. අපව තෝරා ගෙන කැඳවා ඇත.
* කුණු කසල වැනි මිනිස් රාජ්‍යයෙන් දේව රාජ්‍යය වෙත හැරෙන පැය ඇවිත්, ගැළවීමදායක පැය ඇවිත්, ක්‍රිස්තුන් වහන්සේ තුළ තාත්තාගේ කැමැත්ත අපට අනාවරණය වී ඇත. එහෙයින් රාජ්‍යයේ රජාණන් වන ක්‍රිස්තුන් වහන්සේවම පමණක් මුළු සිතින් අදහා ගනිමු. පිළිගනිමු. එවිට රාජ්‍යය අපගේ ජීවිතවලට මෙන්ම අප දේශයට උදා වනු ඇත.

05. සතිය පුරා ප්‍රායෝගික වීම පිණිස :

* ශු.මතෙව් 5:3-12 දක්වා ක්‍රිස්තුන් වහන්සේගේ කන්ද උඩ දේශනාව මෙනෙහි කරමු. ඊට අනුබද්ධව ජීවත් වෙන්නටඅවශ්‍ය පියවර ගනිමු. අන් අය සමඟ ද මංගල වාක්‍ය ගැන නිතර නිතර කථා බහ කරමු. ප්‍රායෝගික වන්නැයි අවදි කරමු.

06. අවසාන ප්‍රශංසාව :

* ජීවිත සිද්ධීන් , සමාජ සිදුවීම් තුළ සමිඳාණන්ගේ හඬට අවදි කරන්නැයි ශුද්ධාත්ම බලය පතා යාච්ඤා කරමු.
* පුබුදු ගී අංක 24 "සැමට පළමු දෙව් රජය සොයව් ....."

====================

## 2019 පෙබරවාරි මස 11 වන දින සිට 2019 පෙබරවාරි මස 17 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

## 'එවිට ස්වර්ගය විවර විය '

01. ප්‍රශංසව සඳහා:

* ශු.මතෙව් 3:16 **"ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබ, එකෙණෙහිම දියෙන් ගොඩ ආ සේක. එවිට ස්වර්ගය විවර විය."**

* එතැන් පටන් ක්‍රිස්තුන් වහන්සේගේ මුළු ජීවිත කාලය පුරාම ස්වර්ග රාජ්‍යය විවෘතව තිබුණා. මන්ද ක්‍රිස්තුන් වහන්සේ සෑම මොහොතකම නිරතුරුවම තම පියාණන්ගේ කැමැත්ත ඉටු කළා පමණක් නොව මහෝත්තමයාණන් සමඟ ගැඹුරු සම්බන්ධකමක් තුළ සිටියා.

* ක්‍රිස්තුන් වහන්සේ කරණා කොට ගෙන අප යාච්ඤා කරද්දී ඔවුන් වහන්සේගේ බෞතිස්ම අත්දැකීමට අපිදු ඇතුළු වන්නෙමු. මනස්ස්ථාපනය වීම , ශුද්ධාත්ම ස්නාපනය ලැබීම, පුත්‍රභාවයේ අනන්‍යතාවය, දේව කැමැත්ත ඉටු වීම, ස්වර්ගය විවර වීම, පියාණන් සමඟ ගැඹුරු සම්බන්ධතාවයකට ඇතුළු වීම.... ලෝක ඉතිහාසය දෙබෑ කළ සමිඳාණන්ගේ දේව පුත්‍රභාවයේ අත්දැකීමට මේ මොහොතේ අපි ඇතුළු වෙමු. ශුද්ධාත්ම ස්නාපනයටක හදවත් විවෘත කරමු.

* පුබුදු ගී අංක 140 "මිහි දෙරණේ මා ...."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමු.

03. සතියේ සුපුවත :

* "ස්වර්ග රාජ්‍යය විවර විය..." වසර 30ක් පුරා එදා සමාජය තුළඔවුන් වහන්සේ දුටු මනුෂ්‍ය රාජ්‍යයට වඩා, සම්පූර්ණයෙන්ම වෙනස් වූ තාත්තාගේ රාජ්‍යය ඔවුන් වහන්සේ දුටුවා. ආත්මාර්ථකාමී පාපිෂ්ඨ වූ මිනිස් රාජ්‍යය මෙන් නොව ශුද්ධවූ රාජ්‍යයේ ප්‍රේමයෙන් පිරුණු රාජ්‍යයේ, දිළින්දා, දුබලයා, අසරණයා ඔසවනු ලබන රාජ්‍යයක්, පව්කරුවා ශුද්ධවන්ත කරන, ධර්මිෂ්ඨ කරන රාජ්‍යයක් ඔවුන් වහන්සේ අත්දුටු ස්වර්ග රාජ්‍යය පොළෝ තලයේ පිහිටුවන්නට දැඩි අධිෂ්ඨානයකින් ඔවුන් වහන්සේ දියෙන් ගොඩ ආ සේක.

(අ) ශු.මතෙව් 3:16 වගන්තිය කුඩා කණ්ඩායම් තුළ කියවා මෙනෙහි කරමින්, ක්‍රිස්තුන් වහන්සේගේ ඇතුලාන්ත අත්දැකීම බෙදා ගන්න.

(ආ) ශු.මාක් 9:2-7 (අන්‍යරූප විලාශය) වගන්ති කියවා කඳු මුදුනේදී දේව බලය, දේව කැමැත්ත අනාවරණය වූ අයුරු, ස්වර්ගය විවර වූ අයුරු මෙන්ම දේව තාත්තාගේ එකම පුත්‍රයාණන් හැටියට මුළු මිනිස් සංහතියම මනස්ස්ථාපනයට කැඳවීම සඳහා ඒ මොහොතේ ඔවුන් වහන්සේ තුළ වූ අත්දැකීම බෙදා ගන්න.

(ඇ) ශු.ලූක් 4:3-4 (පරික්ෂා කරනු ලැබීම) දින 40ක් පුරාම පාළුකරයේදී පවා දේව පුත්‍රයාණන්ට ස්වර්ගය විවර වී තිබුණා. සාතන් පරාජය කළා. දේව කැමැත්ත, සැලැස්ම මොනතරම් අභිමානවත් ද? අභිරහස්මක ද යන්න බෙදා ගන්න. ශුද්ධාත්මයාණන්ට ඉඩ දෙන්න දකින්නට සලස්වන්න.

(ඈ) ශු.ලූක් 23:46 (ජේසුස් වහන්සේගේ මරණය) කුරුස ගසේදීත් එම ස්වර්ගය විවර වී තිබුණි. "පියාණෙනි ඔබ හස්තයට මාගේ ආත්මය භාර දෙමි"යි වදාළ සේක. කුරුස ගසේදී පවා ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගය අත්දුටු අයුරු බෙදා ගන්න.

04. සතිය පුරා ප්‍රායෝගික වීම සඳහා :

i සාතන් පරාජය කොට දුර්පරික්ෂාවෙන් ජය ගන්නට, පාප පරික්ෂා ප්‍රතික්ෂේප කරන්නට, දේව පුත්‍රභාවය තුළ ක්‍රිස්තුන් වහන්සේ කරණා කොට ගෙන බෞතිස්මයේ බලය අප සතුව ඇත. එහෙයින් දිනපතා පසුතැවී සිත් හරවා ගනිමු.

ii එවිට ස්වර්ගය අප ඉදිරියේ විවර වී තිබෙන සැටි දකින්නෙමු. "මනස්ස්ථාපනය වන්න; ස්වර්ග රාජ්‍යය අසන්නය" දිනපතා මගේ පැය මගින් දේව පුත්‍රභාවයේ අනන්‍යතාවය ගැඹුරු කර ගනිමු. දේව රාජ්‍යය පතුරුවන්නට දැඩි අධිෂ්ඨානයක් ඇති කර ගනිමින් රාජ්‍යය සඳහා පුතෙක් - දුවෙක් වන්නට පියවර ගනිමු.

05. අවසාන යැදුම :

* ක්‍රිස්තුන් වහන්සේගේ ස්වාමිත්වයට මුළුමනින් නතු වීමට පිපාසයක් ඇති කරන්නැයි ශුද්ධාත්මයාණන්ගේ බලය පතා යාච්ඤා කරමු.

* පුබුදු ගී අංක 198 "කුරුසියේ පුදසුනෙන්....."

=======================